කවරයේ කතාව

# විකල්ප විදුලි බලය නිපදවීමේ

# ලොව ප්‍රවණතා

**ප්‍රධාන විදුලි බලාගාර ක්‍රමවලට අමතර විකල්ප විදුලි බලශක්ති උත්පාදන ක්‍රම පිළිබඳ ලෝකය ද අවධානය යොමු කොට ඇත. සමහර රටවල මේ සඳහා වෙනම අමාත්‍යාංශ පවා ඇත. ඒ ඔවුන් තමන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ඇති නිසාය.**

## ඉන්දියාව

ඉන්දියාවේ මෙගාවොට් 25 ට අඩු කුඩා ජල විදුලි බලාගාර ප්‍රවර්ධනය කිරීම සඳහා වෙනම අමාත්‍යාංශයක් ඇත. USD මිලියන 2 ට වඩා අඩු ආයෝජන වලින් පරිසරයට සිදුවන සුළු හානිය ඉන්දියාව නොතකා හරී. USD මිලියන 5 දක්වා ආයෝජනයන් සඳහා පූර්ණ පරිසර හිතකාමීත්වය අවශ්‍ය නොවන අතර ඒ වෙනුවට යම් යම් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

කුඩා පරිමාණ ජල ව්‍යාපෘති සඳහා වර්ග 2 ක විදුලිය මිලදී ගැනීමේ ක්‍රමයක් 1995 ජූනි මස සිට ඉන්දියාව භාවිත කරයි. ඔවුන් 2002 වන විට කුඩා ජල ව්‍යාපෘති සඳහා ස්ථාන 399 ක් හඳුනාගෙන ඇත. එහි පූර්ණ ධාරිතාව මෙගාවොට් 107,000 ක් වෙයි. ඉන්දියානු රජය එය මිලදී ගන්නා අවම මිල ඉන්දියානු රුපියල් 2.25 කි. එම මිලදී ගැනීම සඳහා ගෙවන මුදල වසර 10 ක් පුරා වසරකට 5 % බැගින් වර්ධනය වේ. එසේම ඉන්දියාව 2004 වසර් සිට 2015 දක්වා කාලය තුළ එරට සියලුම ගම්මාන වලට විදුලිය සැපයීමට බලාපොරොත්තු වෙයි.

## චීනය

කුඩා පරිමාන ජල විදුලි බලාගාර සම්බන්ධයෙන් චීනය ලෝකයේ පෙරමුණට එයි. එය 2001 වසරේ ලෝකයේ කුඩා පරිමාණ ජල විදුලි ප්‍රමාණයෙන් 39 % කි. කුඩා පරිමාණ බලාගාර 43,027 කින් මෙගාවොට් 26,262 ක ධාරිතාවක් චීනය උත්පාදනය කරයි. එය ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ජල බලාගාර සංඛ්‍යාව මෙන් 22 ගුණයකි.

වාර්ෂික උත්පාදනය ගිගාවොට් පැය 87,100 කි. එය ලංකාවේ වාර්ෂික ඉල්ලුම මෙන් 12 ගුණයකි.

2001 වසරේ චීනය 98 % විදුලි බලය ලබාගෙන ඇත්තේ කුඩා පරිමාණ ජල විදුලි බලාගාර අංශය තුළිනි.

1985 දී එය 63.3 % ක් විය. චීන රජය හා පළාත් පාලන ආයතන ජනතාවට මෙවැනි ව්‍යාපෘති සඳහා "ස්වයං ගොඩනැඟීම ", "ස්වයං කළමණාකරනය" ස්වයං පරිභෝජනය " යන සංකල්ප තුන පදනම් කර ගෙන පූර්ණ දායකත්වය හා අනුග්‍රහය සපය යි.

චීනය කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘති සඳහා වූ වැට් බද්ද 5 % අඩු කරන ලද අතර මහා පරිමාණ බලශක්ති ව්‍යාපෘති සඳහා වූ වැට් බද්ද 17 % කින් වැඩි කොට ඇත.

## එක්සත් ජනපදය

දේශීය සම්පත් වැඩි දියුණු කිරීම හා බනිජ තෙල් මත යැපීම අඩු කිරීම, පිරිසි ගිය ගල් අඟුරු තාක්ෂණය, කොළ පැහැති ශක්තිය සංවර්ධනය සඳහා පර්යේෂණ කිරීම.සුළං මඟින් බල ශක්තිය තඟා සිටුවීම පදනම් කර ගෙන දිරි දීමනා තුළින් මෙවැනි ව්‍යාපෘති වලට සහයෝගීතාව පළ කරයි.

## ජර්මනිය

ජර්මනිය එහි පොසිල ඉන්ධන හා න්‍යෂ්ටික බලය වෙනුවට සුළං බලය යොදා ගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටියි. එරට සුළං බලය මඟින් විදුලිය උත්පාදනය කිරීමේ ලෝකයෙන්ම පුදුමයක් බවට පත්ව සිටියි.

සුළඟින් පමණක් මෙගාවොට් 13,800 ක විදුලිය බලයක් ජර්මනිය නිපදවයි. එනම් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ඉල්ලුම මෙන් 13 ගුණයකි. ප්‍රාග්ධන සහනාධාර ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීමේ පහසුව මෙයට හේතු වී ඇත. Electricity Feed – in Law (EFL) නම් නීතිය යටතේ ප්‍රතිජනනය කළ හැකි විදුලිය සඳහා ස්ථාවර මිලක් සපයා ඇත.

එමඟින් ඕනෑම පුද්ගලයකුට සුළං ටර්බයිනයක් යොදා ගනු ලබන විදුලිය ජාතික විදුලිබල ජාලයට එක් කළ හැකිය.

## ඩෙන්මාර්කය

1996 විදුලිබල පනත යටතේ EFLආකාරයේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම තුළින් ඩෙන්මාර්කය ද සාර්ථකත්වයට පත් වී ඇත. එමඟින් ප්‍රතිජනනය කළ හැකි බල ශක්ති මූලාශ්‍රවලට මූලිකත්වය දෙයි.

ඩෙන්මාර්කය සුළං බලය මඟින් ජනනය කරන විදුලිය බලය මඟින් එරට විදුලි අවශ්‍යතාවන් සඳහා 16% ක් දහවල් කාලයේ දී ද, 50% ක් රාත්‍රී කාලයේ දී ද සපයයි. ස්පාඤ්ඤයේ ද සුළං බල විදුලිය නිපදවීමේ ව්‍යාපෘතින් වසර 5 තුළ තුන් ගුණයකින් වැඩි කිරීමට සැලසුම් කර ඇත.

## ජපානය

ජපානය සතුව සුළං හෝ කුඩා පරිමාණ ජල මූලාශ්‍ර හෝ නොමැති නිසා සූර්ය ශක්තිය උපයෝගී කර ගැනීමට සිදු කරයි. මෙමඟින් ජපානය සූර්ය ශක්තිය සම්බන්ධ කර්මාන්තයේ ලොව ප්‍රමුඛයා වෙයි.

## නොර්වේ

නෝර්වේ රජය 30% සහනාධාර හා 40% ක්‍රියාත්මක කිරීමේ වියදම දරමින් සුළං බල ශක්තියට දිරි ගන්වයි.

❑

**ඉන්දික කුඩාහෙට්ටි**